# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 14,922/6 — 1970 සැප්තැම්බර් 11 වැනි සිකුරාද — 1970.9.11

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)

# IV වැනි කොටස—පළාත් පාලනය

(වෙන වෙනම ගොනුකරගතහැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාගයකට වෙන වෙනම පිටු අංක යොද ඇත.)

## පළාත් පාලන දැන්වීම්

එල්.ජී.—බී. 29/70

### නගර සභා ආඥාපනත

#### 184 වැනි වගන්තිය යටතේ ආඥාව

(255 වැනි අධිකාරය වන) නගර සභා ආඥාපනතේ 184 වැනි වගන්තියේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ වැඩ බලන ඇමති විලියම් නිල් ද අල්විස් වන මම, බලංගොඩ නගර සභාව සම්බන්ධයෙන්—

(අ) එකී ආඥාපනතින් පැවරී ඇති රාජකාරී කටයුතු ඉටු කිරීම වුවමනාවෙන්ම පැහැර හැරීම හෝ එම රාජකාරී කටයුතු ඉටු කිරීමෙහි ලා විධිමාවාරයෙන් කටයුතු කිරීම ; සහ

(ආ) අදක්ෂතාවය සහ අයථා පාලනය,

යන මේවා ඔප්පු වන ප්‍රමාණවත් සාක්ෂි තිබෙන බවට සෑහීමට පත්ව, මෙම ආඥාවෙන්—

(අ) බලංගොඩ නගර සභාව විසුරුවා හරිමි ; තවද,

(ආ) ඒ නගරය සඳහා එකී ආඥාපනත යටතේ අළුත් නගර සභාවක් සංස්ථාපනය කර ගන්නාතුරු බලංගොඩ නගරයේ කටයුතු පාලනය කිරීම පිණිසද, ඒ කාර්ය්‍යය සඳහා එකී ආඥාපනත යටතේ නගර සභාවක බලතල ක්‍රියාවෙහි යෙදවීම සහ යුතුකම් ඉටුකිරීම පිණිසද, විශේෂ කොමසාරිස්වරයා වශයෙන් පළාත් පාලන සහකාර කොමසාරිස් අමරවික්‍රම රූපසිංහ කරුණාරත්න මහතා පත් කරමි.

නිල් ද අල්විස්,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ
කටයුතු පිළිබඳ වැඩ බලන ඇමති.

1970 සැප්තැම්බර් මස 11 දින,
කොළඹ දිය.

9–759

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයාධිපතිගේ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

618/7——ජේ 16761—5,450 (70/9)